**ගරු නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගේ 2008 ලෝක ජනාවාස දින පණිවුඩය**



22 වැනි ලෝක ජනාවාස දිනය වෙනුවෙන් නිවාස හා පොදු පහසුකම් ඇමතිනිය ලෙස මෙම පණිවුඩය නිකුත් කිරීමට ලැබීම ගැන සතුටු වෙමි.

එක්සත් ජාතීන්ගේ ජනාවාස කොමිසම විසින් මෙවර ලෝක ජනාවාස දින තේමාව ලෙස "**සහජීවන පුරවරය** " යන්න තෝරාගෙන තිබේ. සීඝ්‍ර නාගරීකරණය තුළ පිවත්වන වර්තමාන සමාජයට එකිනෙකා සමග මෙන්ම තම පරිසරය සහග සහජීවනයෙන් වාසය කිරීමේ වටිනාකම අමතක වී ඇති මෙවන් යුගයක ලෝක ජනාවාස දිනය හරහා හෝ කෙරෙන මෙම කෙරෙන සිහිකැඳවීම ඉතා කාලෝචිතය. ශ්‍රී ලංකාව වැනි විවිධ ජාතීන් හා ආගම්වලට අයත් ජන සමූහයක් වෙසෙන රටකට මෙහි වටිනාකම වඩාත් තිවූ ලෙස දැනේ.

මෙම පණිවිඩය වැඩිහිටියන් හා සමස්ථ සමාජය වෙත රැගෙන යාමට වඩාත්ම සුදුසු මාධ්‍යය ලෙස ළමා පරපුර එලදායී ලෙස ඒ සඳහා සම්බන්ධ කර ගනිමින් මෙවර ද ලෝක ජනාවාස දින සැමරුම් වැඩසටහන් අපි සංවිධානය කළෙමු. ළමා පරපුරට මෙවන් යහපත් පුරුදු හදුන්වාදිම තුළින් ඔවුන් එකිනෙකා සමග මෙන්ම සිය පරිසරය සමග ද සහජීවනයෙන් වැඩෙනු ඇත. 2008 ලෝක ජනාවාස දිනය නිමිතිකොට ගෙන පාසල් සිසුන් සඳහා වැඩමුළු හා විවිධ තරග රැසක් ද පැවැත්වෙන්නේ මේ අරමුණ ඉටුකර ගැනිම සඳහා ය.

ලෝක ජනාවාස දින සැමරුමකට සීමා නොකර, අඩු ආදායම්ලාභි ජනතාවගේ ජීවිත තත්ත්වය වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් සංවර්ධන කාර්යයන් රැසක් සංවිධානය කර ඇත. මේ ඇරඹෙන වැඩපිළිවෙල අදාළ සියළු ආයතන හා ඔබ සැමගේ දායකත්වයෙන් සාර්ථක කරගැනිම තුළින් ජීවත්වීම සඳහා වඩාත් උචිත මානව ජනාවාස බිහිකිරීම අපගේ අරමුණයි. මෙම සියළු කාර්යයන් හරහා ලෝක ජනාවාස දිනයෙහි සැබෑ අරුත අපට අවබෝධ කරගැනිමට හැකිවනු ඇති බව මම විශ්වාස කරමි.

මෙම කාර්යය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භයේ සිටම උර දී කටයුතු කළ නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා හා කාර්ය මණ්ඩලයටත්, මොරටුව නගරාධිපති ගරු සමන් ලාල් ප්‍රනාන්දු මැතිතුමාටත් , නිරතුරුව මා සමග එක්ව කටයුතු කරන අප අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් , මේ සඳහා නන් අයුරින් සහායෝගය ලබාදෙන සැම දෙනාටමත් මාගේ ස්තුතිය සහ සුභාශිංසනය මෙයින් පිරිනමමි.

**ෆේරියල් ඉස්මයිල් අෂ්රොෆ්**
**නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය**